# අද මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනයයි.

ලෝකෙ පුරාම ස්ත්‍රීන් විවිධාකාරයෙන් අද දිනය සමරනවා.

## ලංකාවේ අපේ හඬ කුමක් සඳහාද?







### අද දවසේ අපේ ඉල්ලීම් මොනවාද?

**වැඩිවන බඩුමිල නිසා වැඩියෙන්ම තැලෙන්නේ ස්ත්‍රීන් වන අපි**

හාල් සේරුවක් රු. 80යි.
ගෑස් සිලින්ඩරයක් රු. 1750/- යි
පොල් ගෙඩියක් රු. 45/- යි
විදුලි බිල, වතුර බිල ඉහළ නගිනවා
ප්‍රවාහන ගාස්තු අපි නොදැනීම වැඩිවෙනවා






**හැමදේම ගිනිගණන්...**

# ඒ විතරක් ද?...

- යුද්ධයෙන් මිය යන්නේ, අතුරුදහන් වෙන්නේ අපේ දරුවෝ. දෙමළ වුනත්, සිංහල වුනත්, මුස්ලිම් වුනත් අපි ලෝකෙට බිහිකළ ජීවිත,
- කුරිරු යුද්ධයේ ප්‍රචණ්ඩත්වයෙන් අවතැන් වන දහස්ගණන් මිනිසුන් අතරේ වැඩියෙන් අනාරක්ෂිත වන්නේ ස්ත්‍රීන් වන අපි,
- රටේ සිවිල් ජන ජීවිතය බිඳ වැටීම හේතුවෙන් අහිමි වන ජීවිත වගේම, අතුරුදහන් වන දරුවන්, සැමියන්, ඥාතීන් වෙනුවෙන් තාඩන පීඩන උසුලන්නේ ද ස්ත්‍රීන් වන අපි,
- යුද්ධයේ තවත් ප්‍රතිඵලයක් ලෙසින් වැන්දඹු බිරින්ඳෑවරුන්, තනි මව්වරුන් හැටියට පවුලේ සියලු බර දරන්නේ ද ස්ත්‍රීන් වන අපි,
- ලිංගික හිරිහැර සහ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙමින්, දූෂණයට ලක්වෙමින්, ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ගයට වැඩිවශයෙන් උරදෙන්නේ ද ස්ත්‍රීන් වන අපි,
- මඟ තොට හිරිහැර විඳිමින්, අඩු පඩියට වැඩ කරමින් වෘත්තීය අයිතීන් පවා නොමැතිව ඇඟලුම් කම්හල්වල ශ්‍රමය වගුරමින් රටට ආදායම් ගෙනෙන්නේ ස්ත්‍රීන් වන අපි.
- සමාන වැඩට අසමාන වැටුප් ලබමින් කෘෂි කර්මාන්තයේ දී ත්, ඉතා දුෂ්කර සේවා තත්ත්වයන් යටතේ වැවිලිකරයේ දීත් රටේ ආර්ථිකය නංවන්නට ශ්‍රමය වගුරන්නේ ස්ත්‍රීන් වන අපි,
- දරුවන් හදමින්, වඩමින්, ගෙදර දොර කුදු මහත් මෙහෙවරයන් කරමින්, ඒ සඳහා කිසිදු ඇගයීමක් හෝ වටිනාකමක් නොලබමින් සමාජයේ ඉදිරි ගමනට දායක වන්නේ ද ස්ත්‍රීන් වන අපි,
- පාසැලේ දී, රෝහලේ දී, වැඩපලේ දී විතරක් නොවේ මඟතොට දී දූෂණයට, ලිංගික අතවරයට ගොදුරු වන්නේ ද,විවිධ සමාජ පීඩනයනවලට ලක්වන්නේ ද ස්ත්‍රීන් වන අපි.

**ඒත් මේ රටේ තීන්දු ගන්නා මණ්ඩලවලට අපේ සහභාගිත්වය ප්‍රමාණවත් ලෙස පවතිනවාද?**

- පාර්ලිමේන්තුවේ කාන්තා මන්ත්‍රීවරියන් අත් දෙකේ ඇඟිලි ගාණට තරම්
- එතකොට පළාත් සභා, ප්‍රාදේශීය සභා මේ සියලු ස්ථානවල ඉතාමත් සුළු ප්‍රතිශතයන්
- අපේ රට නිදහසේ 60 වෙනි වසර සැමරුවේ ඊයේ පෙරේදා

**60 වසරකට පස්සේ මේ රටේ කාන්තාවන්ගේ තත්ත්වය දිහා ආපසු හැරිලා බලන විට අපිට සතුටු විය හැකිද? ඇත්තටම බැහැ.**

**එසේනම් අපිට මේ තත්ත්වය වෙනස් කළ හැක්කේ කොහොමද? හැමදාමත් අප ඉදිරියේ පවතින අභියෝගය එයයි.**

අසමාන සැලකීම්වලින් තොරව හිංසාවට පීඩාවට ලක්නොවී පූර්ණ මනුෂ්‍යත්වයට උරුමකම් කියන්නට හැකි සාමකාමී සමාජයක් ගොඩනගා ගැනීමට අප හමුවේ ඇත්තේ සුවිශාල වගකීමකි.

**මව්වරුනි, සොහොයුරියනි එන්න, ඒ සඳහා අත්වැල් බැඳගනිමු.!**

- ලක්බිමේ මව්වරු සහ දියණියෝ